කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය - 2015
-------------------------------------------------------------------
කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2008 අංක 02 දරන කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 27 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ **2.2** ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** මූල්‍ය ප්‍රකාශන

---------------

**2.1** තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ **2.2** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් **2015** දෙසැම්බර් **31** දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

**2.2.1** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ආයතනයේ සියලු වත්කම් හා වගකීම් සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් විසිඑක්වන සියවසය සඳහා උසස් අධ්‍යාපනය (**HETC**) ව්‍යාපෘතිය යටතේ **2014** සහ **2015** වර්ෂවලදී ලැබී තිබුණු, ආයතනය විසින් තවදුරටත් භාවිතයට ගන්නා රු. **6,102,110** ක් වටිනා ජංගම නොවන වත්කම් අයිතම **26** ක් ගිණුම්ගත කර නොතිබුණි. මෙම අයිතම ස්ථාවර වත්කම් ලේඛනය තුළද ඇතුළත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. **693,065** ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත **03** ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2** ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

ආයතනය වෙත විදුලිය ලබා ගැනීමේදී විදුලි ට්‍රාන්ස්ෆෝමරයක් සවිකිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත **2014** අගෝස්තු **19** දින රු.**2,598,600** ක් ගෙවා තිබූ අතර ට්‍රාන්ස්ෆෝමරයේ සිට නේවාසිකාගාරය වෙත හා පරිපාලන ගොඩනැගිලි වෙත විදුලිය සම්ප්‍රේෂණය සඳහා **2015** පෙබරවාරි **05** දින රු **2,594,145** ක වියදම් දරා තිබුණි. එකම කාර්යයක් සඳහා ගෙවන ලද මෙම වියදම් කාණ්ඩ **2** න් විදුලිබල මණ්ඩලයට ගෙවූ මුදල විලම්භිත අයභාර වියදමක් ලෙස හඳුනාගෙන අවුරුදු **10** ක් තුළ ලාභයට එරෙහිව ලියා හැරීමට තීරණය කර තිබූ නමුත් සම්ප්‍රේෂණ වියදම ජංගම නොවන වත්කමක් ලෙස හඳුනාගෙන සියයට **20** බැගින් ක්ෂය කර තිබුණි. මේ අනුව එකම කාර්යයක් වෙනුවෙන් දැරූ වියදම් ගිණුම් ප්‍රතිපත්ති **2** ක් භාවිතා කර ගිණුම්ගත කර තිබූ බව නිරීක්ෂණය විය.

**2.2.3** ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **2008,2009** සහ **2010** වර්ෂයන්හි මිලදී ගත් රු.**240,520** ක් වූ පරිගණක හා උපාංග සම්බන්ධයෙන් අනුගමනය කළ ක්ෂය ප්‍රතිපත්තිය අනුව **2015** දෙසැම්බර් **31** දිනට, එහි වටිනාකම් ශුන්‍ය විය යුතු නමුත් ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් ශුද්ධ වටිනාකම රු **21,759** ක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ආ) කෘෂි තාක්ෂණ උපාධි පාඨමාලාවේ **17** වන හා **16** වන අදියරයන්හි පාඨමාලාව හදාරන ශිෂ්‍යයන් **25** දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.**187,500** ක්වූ පාඨමාලා ගාස්තු ගිණුම් ගතකර නොතිබුණි.

**2.2.4** පැහැදිලි නොකළ වෙනස්කම්
------------------------------

ආයතනය විසින් පවත්වාගෙන යන තොග ලේඛනයන්ට අනුව ඉතිරි කෙසෙල් පැල ප්‍රමාණය **39650** ක් වුවත් භෞතික තොග පරීක්ෂාවට අනුව එම අගය **38650** ක් වුයෙන් රු. **60,760** ක් වටිනා කෙසෙල් පැල **1000** ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3** ලැබිය යුතු ශේෂ
-----------------

ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන මඟින් ගොවීන් තුන්දෙනෙකුට **2012** වර්ෂයේ දී ලබාදී තිබුණු ණය මුදලින් රු. **83,800** ක හිඟ ණය වාරික අයකර ගැනීමට ආයතනය අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.4** නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි **138** හා **139** | වවුචරයක් සහතික කිරීමේදී හා ගෙවීම් කිරීමේදී අදාළ වවුචර් සියළු අතින්ම සම්පූර්ණ වීම හා විධිමත් කුවිතාන්සියකින් ගෙවීම තහවුරු කර ගත යුතු වුවත්, පුවත්පත් දැන්වීමක් පළකිරීමට අදාළව හා අන්තර් ජාතික වැඩමුළුවකට අදාලව වැය බිල්පත් නොමැතිව එකතුව රු.**207,654** ක අත්තිකාරම් පියවීම් වවුචර් සහතික කර තිබුණි. |
| මුදල් රෙගුලාසි **371** | (i) අත්තිකාරමක් ලබාදීම හුදෙක් මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් සීමා විය යුතු වුවත් මාණ්ඩලික නොවන නිලධාරීන් **14** දෙනෙකු වෙත අවස්ථා **69** කදී එකතු වටිනාකම රු.**2,487,240** ක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| | (ii) අදාල කාර්යය නිම කළ විගස අත්තිකාරම් පියවිය |

යුතු වුවත් අවස්ථා 44 ක දී ලබාගෙන තිබූ එකතුව රු.1,853,487 ක අත්තිකාරම් පියවීම සඳහා දින 47 සිට දින 237 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.

(ආ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය

වරකට ලබාදිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු.100,000 ක් වුවත් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනි ලෙස අවස්ථා දෙකකදි රු.110,000 සිට රු.170,637 දක්වා පරාසයක් තුළ අත්තිකාරම් ලබා දී තිබුණි.

**2.5** ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පාඨමාලාවෙහි 16 වැනි අදියරෙහි වූ ගොවි පුහුණු වැඩසටහන සඳහා 2015 අප්‍රේල් සිට සැප්තැම්බර් අතර කාලය තුළ බාහිර පුද්ගලයකුගේ අක්කර 2 ½ ක කුඹුරක් යොදාගෙන තිබුණ ද කුඹුර ලබා ගැනීමට හා වියදම් දැරීමට කළමනාකරණ මණ්ඩලයෙහි අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**3.** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.5,991,049 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,789,001 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,780,050 ක වර්ධනයක් සිදුවී තිබුණි. රජයේ ප්‍රදාන රු.12,000,000කින් වැඩිවී තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් සිදු වී තිබූ අතර 2014 වර්ෂයේ ඌනතාවයක් හා 2015 වර්ෂයේ අතිරික්තයක්ද ඇති වී තිබුණි.කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී ආයතනයේ දායකත්වය 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ක්‍රමයෙන් වැඩි වී තිබුණද පිළිවෙලින් රු.14,477,841ක් , රු.10,995,932 ක් හා රු.34,603,218 ක් විය. 2014 වර්ෂයේදී දායකත්වය පිරිහී තිබුණි. නමුත් 2015 වර්ෂයේදී එය සියයට 215 කින් වර්ධනය වී රු.34,603,218 ක් වී තිබුණි.

**3.2** විග්‍රහාත්මක සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2015 වර්ෂයේ ආයතනයේ ජංගම අනුපාතය 90:1 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එය 61.3:1 ක් විය. මෙසේ ජංගම අනුපාතය ඉහළ අගයක් පෙන්නුම් කළ ද වත්කම්වලින් සියයට 92 ක් නියෝජනය කරනුයේ බැංකු ශේෂයෙනි. ඒ අනුව ආයතනයේ විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුළ රඳවාගෙන තිබුණි.

**4.** මෙහෙයුම් සමාලෝචනය

**4.1** කාර්යසාධනය

2008 අංක 2 දරන කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලිය අනුව කෘෂිකර්ම හා කෘෂි තාක්ෂණයේ සහ කෘෂි තාක්ෂණය සහ ග්‍රාමීය විද්‍යා මූලිකාංග පිළිබඳ උසස් අධ්‍යාපනයේ දැනට යෙදී සිටින තැනැත්තන් සඳහා උසස් අධ්‍යාපනය ලබාදීම, ප්‍රවර්ධනය සහ වර්ධනය කිරීම ප්‍රධාන අරමුණ විය.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උපාධි පාඨමාලාව, ඩිප්ලෝමා අදියර, උසස් ඩිප්ලෝමා අදියර හා උපාධි අදියර ලෙස අදියර තුනකින් සමන්විත වන අතර පාඨමාලාව සඳහා ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 44 සිට සියයට 75 දක්වා ප්‍රතිශතයක් ඩිප්ලෝමා අදියර සම්පූර්ණ කිරීමකින් තොරව පාඨමාලාව අතහැර ගොස් තිබුණි. තවද උපාධි අදියරේ අවසන් ව්‍යාපෘතිය දක්වා අධ්‍යයන කටයුතු වල නිරත වන ශිෂ්‍ය සංඛ්‍යාව මුලින් බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 17 - සියයට 23 අතර සුළු පිරිසක් බව නිරීක්ෂණය විය.

(ආ) ආයතනය විසින් පවත්වාගෙන යන කෘෂි තාක්ෂණ උපාධි පාඨමාලාවෙහි අධ්‍යයන කාල සීමාව අවුරුදු 4 මාස 6 ක් වුවත් 2009 වර්ෂයෙහි උපාධි පාඨමාලාව සඳහා පළමු ශිෂ්‍ය කණ්ඩායම බඳවාගෙන අවුරුදු 7 ½ ක් ගතවී ඇතත් පාඨමාලාව අවසන් කර නොතිබුණි.

(ඇ) උපාධි පාඨමාලාවේ අත්‍යාවශ්‍ය අංගයක් වන ප්‍රායෝගික ගොවි පුහුණු වැඩසටහන (Farm Practice) සඳහා ආයතනය වෙත කුඹුරක් අත්‍යාවශ්‍යව පැවතියද කුඹුරක් ස්ථිරව ආයතනය වෙත ලබාගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබූ අතර 2016 වර්ෂයේ ගොවි පුහුණු වැඩසටහන සඳහා වගා කන්නයකට රු. 6,000 ක මුදලක් ගෙවා පර්චස් 1 ත් 2 ත් අතර ඉතා කුඩා කුඹුරක් ලබාගෙන තිබුණි.

(ඈ) විගණිත දිනය වන විට පටක රෝපණ කෙසෙල් පැල 41,000 කට අධික ප්‍රමාණයක් සඳහා සම්පූර්ණ කළ නොහැකි වූ ඇණවුම් පැවතිය දී හා ආයතනය වෙත කීර්තිනාමයක් ගොඩ නැගෙමින් තිබීය දී කෙසෙල් පැල නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමට හා කෙසෙල් පැලයක නිෂ්පාදන පිරිවැය අඩුකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.2** මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------

වර්ෂ කිහිපයකට ඉහතදී මිලදීගෙන කල් ඉකුත් වී තිබූ රු. 109,662 ක් වටිනා රසායන ද්‍රව්‍ය තොගය , විධිමත් විමර්ශණයක් සිදු කිරීමකින් තොරව 2015 වර්ෂය තුළ විනාශ කර තිබුණි.

**4.3** මතභේදයට තුඩුදෙන ගණුදෙනු

--------------------------------

තාක්ෂණික විෂය ධාරාව යටතේ උපාධි පාඨමාලා ආරම්භ කර නොතිබියදී 2014 ඔක්තෝබර් 18 දින සිට කාර්ය පැවරුම් මත ව්‍යාපෘති කළමණාකරුවකු බඳවාගෙන 2014 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් රු.225,000 ක් හා රු.320,000 ක දීමනා ගෙවා තිබුණි.

**4.4** දක්ෂතා අක්‍රමිකතා

-----------------

ගොවි පුහුණු වැඩසටහන මගින් වගාකළ අක්කර 2 ½ ක වී වගාවෙන් කිසිදු අස්වැන්නක් හෝ අස්වැන්නට අදාල ආදායමක් ආයතනය වෙත ලැබී නොතිබුණි.

**4.5** අරමුදල් ඌන උපයෝජනය

-----------------------------

ගිණුම් වර්ෂය ආරම්භයේදී වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ රු. 45,318,622ක ශේෂයක් පැවතිය දී වර්ෂයේ ප්‍රාග්ධන වැයවීම් නිවැරදිව පුරෝකථනය නොකොට භාණ්ඩාගාරය තුළින් රු. 65,000,000ක ප්‍රාග්ධන ප්‍රදානයන් ලබාගෙන වර්ෂය තුළ රු. 14,437,654ක් පමණක් වැයකිරීම හේතුවෙන් රු. 95,880,968ක මුදලක් බැංකු ජංගම ගිණුමක ඌන උපයෝජිතව පැවතුණි.

**4.6** නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ඉදිකළ නේවාසිකාගාර 60 ව්‍යාපෘතිය යටතේ රු.220,096,952 ක් වැයකර 2014 වර්ෂයේදී කාමර 100 කින් සමන්විත නේවාසිකාගාරයක් ඉදිකර තිබූ අතර 2014 – 2016 කාලය තුළ විභාග පැවැත්වෙන දිනවලදී පමණක් මෙම නේවාසිකාගාරයෙන් කාමර 4 ත් 8 ත් අතර ප්‍රමාණයක් පමණක් භාවිතයට ගෙන තිබුණි.

(ආ) ආයතනයෙහි අවශ්‍යතාවය හා අවශ්‍ය වන කාලය පිළිබඳව නිසි පුරෝකථනයකින් තොරව භාණ්ඩ මිලදී ගැනීම හේතුවෙන් රු 84,214 ක් වටිනා ඡායා පිටපත් යන්ත්‍ර සඳහා භාවිතා කරන ටෝනර් 11ක් වර්ෂයකට අධික කාලයක සිට ගබඩා කර තිබුණි.

**4.7** ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

පාඨමාලාවේ පළමු අදියර වූ ඩිප්ලෝමා අදියර සමත් වූ දෙවන හා තෙවන ශිෂ්‍ය කණ්ඩායම්වල ශිෂ්‍යයන් 53 දෙනෙකු වෙත සහතික පත්‍ර ප්‍රදානය සඳහා ආයතනයෙහි ශ්‍රවනාගාරය භාවිතා කළ හැකිව තිබියදී හම්බන්තොට අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාව යොදාගැනීම වෙනුවෙන් රු. 350,000 ක මුදලක් වැය කර තිබුණි.

**4.8** කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------

ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් තනතුරු 12 න් තනතුරු 8 ක් ගිණුම් වර්ෂය අවසාන දින වනවිටත් පුරප්පාඩුව පවතින අතර පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු නොකොට උසස් අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියකින් තොරව කාර්ය පැවරුම් පදනම මත සේවකයින් 28 දෙනෙකු බඳවාගෙන තිබුණි.

**5** ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

**5.1** සංයුක්ත සැලැස්ම

---------------------

සංයුක්ත සැලැස්මට අනුව 2015 වර්ෂය තුළදී කෘෂි තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශිෂ්‍යයන් 175 දෙනෙකු බඳවා ගැනීමට හා හොඳ තත්ත්වයේ පටක රෝපණ කෙසෙල් පැල 240,000 ක්

නිෂ්පාදනය කිරීමට සැලැසුම් කර තිබුණද බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව **118** ක් හා නිෂ්පාදනය කල කෙසෙල් පැල සංඛ්‍යාව **185038** ක් විය.

**6.** පද්ධති හා පාලනයන්

---------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මෙහෙයුම් පාලනය | බඳවාගන්නා සිසුන් පාඨමාලාව අවසානය දක්වා රඳවා ගැනීමට සුදුසු ක්‍රමවේද හඳුන්වා නොදීම. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | ලේඛන යාවත්කාලීන නොකිරීම. |
| (ඇ) | තොග පාලනය | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී නොගැනීම. |
| (ඈ) | මූල්‍ය පාලනය | චක්‍රලේඛවලට අනුකූලව කටයුතු නොකිරීම. |